# විශේෂ නිවේදනය

## කුරුවින්ද පවුලට අයත් මැණික් (Sapphire Varieties) සහ රතුකැට මැණික් වල වර්ණ අස්ථාවරත්වය පිළිබඳ ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ ප්‍රකාශය

ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය (NGJA) විසින් **"කුරුවින්ද පවුලට අයත් මැණික් (Sapphire Varieties) සහ රතුකැට මැණික් වල වර්ණ අස්ථාවරත්වය"** පිළිබඳව The World Jewellery Confederation (CIBJO), The American Gem Trade Association (AGTA) සහ The International Colored Gemstone Association (ICA) විසින් මෑතකදී නිකුත් කරන ලද ඒකාබද්ධ ප්‍රකාශය බැරෑරුම් ලෙස සැලකිල්ලට ගෙන ඇති බව දැනුම් දෙමි.

ශ්‍රී ලංකා රජය සහ මැණික් කර්මාන්තය වෙනුවෙන්, ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය විසින් මෙම කර්මාන්තය කරගෙන යෑමේ දී මැණික් සඳහා සිදුකරනු ලබන කෘත්‍රිම ප්‍රතිකර්ම පිළිබඳ හෙළිදරව් කිරීම සහ ඉහළම මට්ටමේ සදාචාරාත්මක ව්‍යාපාරික පිළිවෙත් පවත්වාගෙන යාම පිළිබඳව සාමූහික කැපවීම තහවුරු කිරීම මෙයින් අදහස් කරයි.

කෘත්‍රිම විකිරණකරණය හේතුවෙන් වර්ණ අස්ථාවරත්වයක් ඇති **කුරුවින්ද පවුලට අයත් මැණික් (Sapphire Varieties) සහ රතුකැට මැණික්,** ශ්‍රී ලංකාවෙන් ජාත්‍යන්තර වෙළඳපොළට ඇතුළු වීම වැළැක්වීම සඳහා අධිකාරිය, කර්මාන්තය සමඟ එක්ව හැකි සෑම පියවරක්ම ගන්නා බවට ජාත්‍යන්තර මැණික් ගැනුම්කරුවන්ට සහතික වෙමු. මෙවැනි **කෘත්‍රිමව විකිරණ කරණය කරනු ලබන ස්ථාන හඳුනා ගැනීම සහ නියාමනය කිරීම, කුරුවින්ද පවුලට අයත් මැණික් (Sapphire Varieties) සඳහා විකිරණ කරණය මඟින් සිදුවන වර්ණ අස්ථාවරත්වය පිළිබඳ දැනුවත්භාවය ගොඩනැගීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම සහ මැණික් අලෙවිකරුවන් අතර මැණික් සඳහා කරනු ලබන කෘත්‍රිම ප්‍රතිකර්ම පිළිබඳ අනාවරණය කිරීමේ නීති ශක්තිමත් කිරීම, මේ පිළිබඳ ඇති නීති රෙගුලාසි ශක්තිමත් කිරීම, දේශීය මැණික් පරීක්ෂාකිරීමේ රසායනාගාර සමඟ කෘත්‍රිම විකිරණකරණය පිළිබඳ තොරතුරු බෙදාගැනීම සහ ඒ පිළිබඳ සංවාදය වැඩිදියුණු කිරීම, " Fade Test " සහ වර්ණ ස්ථායිතා වාර්තාකරණය පිළිබඳ ක්‍රියාපිළිවෙත වැඩිදියුණු කිරීම** දැනට සලකා බලනු ලබන පියවර කිහිපයක් ලෙස දැක්විය හැක.

තවද, ශ්‍රී ලංකාවෙන් මැණික් අපනයනය කිරීමේදී, මෙලෙස විකිරණ බලපෑම ක්‍රියාකාරීත්වයේ පවතින මැණික් පරීක්ෂා කිරීම සඳහා යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීමට මෙම අධිකාරිය අදහස් කරයි. අපනයනයට ඉදිරිපත් කරන ලද කිසියම් මැණික් ගලක් විකිරණශීලී බව ක්‍රියාකාරීව ඇති බව අනාවරණය වුවහොත්, එම මැණික් අපනයනය සඳහා මෙම අධිකාරිය විසින් අනුමත නොකෙරේ.

ශ්‍රී ලංකාවේ සම්භවයක් ඇති කෘත්‍රිම ප්‍රතිකර්ම සිදුනොකළ කහ, පීච් සහ පද්මරාග මැණික් වල වර්ණ තීව්‍රතාවය, විවිධ භූගෝලීය ස්ථානවල UV දර්ශක මත පදනම්ව වෙනස් විය හැකි බව පිළිගත් සංසිද්ධියකි. මෙම සංසිද්ධිය ද එවැනි මැණික් සඳහා කරනු ලබන කෘත්‍රිම ප්‍රතිකර්ම හේතුවෙන් ව්‍යාකූලත්වයට පත්වීමට හේතු විය හැක.

අපගේ අපේක්ෂාව වන්නේ, ප්‍රමුඛ ජාත්‍යන්තර සංවිධාන විසින් ශ්‍රී ලංකාවේ මැණික් කර්මාන්තයේ කීර්ති නාමයට සහ ශ්‍රී ලංකාවේ මැණික් පිළිබඳ ගෝලීය ස්ථාවරයට හානි විය හැකි ප්‍රසිද්ධ නිවේදන නිකුත් කිරීමට ප්‍රථම, මෙම හදිසි අවස්ථාවට මුලින් ප්‍රතිචාර දැක්වීමයි. මෙම අධිකාරිය කර්මාන්තයේ නියාමකයා ලෙස මෙම තත්ත්වය පිළිබඳ සළකා බලනු ඇත.

ශ්‍රී ලංකාවේ මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ නියාමකයා ලෙස මෙම අධිකාරිය, ජාත්‍යන්තර වෙළඳපොළේ මැණික් හා ස්වර්ණාභරණ (ශ්‍රී ලංකාවේ සම්භවයක් ඇති) සඳහා ඇති ඉල්ලුම ප්‍රවර්ධනය කිරීමට සහ අනාගත ගැනුම්කරුවන් අතර මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය පිළිබඳ විශ්වාසය ඇති කිරීමට අවශ්‍ය පියවර ගැනීමට නීතියෙන් පැවරී ඇත. මෙම තත්ත්වය තුළ, ජාත්‍යන්තර මැණික් ව්‍යාපාරය ශක්තිමත් කිරීම සඳහා මැණික් කර්මාන්තය සඳහා යොදාගැනෙන හොඳම පිළිවෙත් ආරක්ෂා කිරීමේ අරමුණින්, අධිකාරිය විසින් ප්‍රතිපත්තිමය සහ නියාමන ක්‍රියාමාර්ග කඩිනමින් අනුගමනය කරනු ඇති අතර හෙළි නොකරනු ලබන කෘත්‍රිම ප්‍රතිකාර්මයන්හි නියැලෙන අයට විරුද්ධව දැඩි රෙගුලාසි සහ දඬුවම් හඳුන්වා දෙනු ඇත.


**සභාපති සහ ප්‍රධාන විධායක නිළධාරී**
ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය
අංක.12, මැක්සන්ස් ගොඩනැගිල්ල, ඇල්ෆ්‍රඩ් හවුස් උද්‍යානය, කොළඹ 03
දුරකතන- 0112329352 / 0112390650 ෆැක්ස් - 0112320971 / 0112328936
වෙබ් අඩවිය: www.ngja.gov.lk
විද්‍යුත් තැපැල් ලිපිනය- chairman@ngja.gov.lk